## 3 ඒකකය- අපේ සංස්කෘතික උරුමය

---

### I කොටස

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

අංක 1- 5 දක්වා ප්‍රශ්න වලට හිස්තැනට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉරි මත ලියන්න.

01. 2011 වන විට යුනෙස්කෝ සංවිධානය විසින් සංස්කෘතික උරුම ................................ නම් කර ඇත.

02. ලංකාවේ පිහිටි ලෝක උරුම ................................ ක් පිහිටා ඇත.

03. මොහෙන්ජොදාරෝ නගරය පිහිටා ඇත්තේ ................................ ය.

04. වෙස් මුහුණු කර්මාන්තයට ප්‍රසිද්ධ ගම්මානය ලෙස ................................දැක්විය හැක.

05. ලාක්ෂා කර්මාන්තය සඳහා ................................ ශාඛය යොදා ගනී.

( කැප්පෙට්ටියා, අම්බලන්ගොඩ, 6ක්, 704 ක්, පකිස්ථානයේ, චීනයේ )

ප්‍රශ්න අංක 6 - 10 දක්වා දී ඇති ප්‍රකාශය හරි නම් √ ලකුණ ද වැරදි නම් × ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

06. ස්පෘෂ්‍ය උරුමය යනු අතින් අල්ලා බැලිය හැකි උරුමයන් වේ. ( )

07. චීන සංස්කෘතියේ ප්‍රබල සංකේතයක් ලෙස චීන මහා ප්‍රාකාරය හඳුන්වා දියහැක. ( )

08. සීගිරිය කලාගාරයක් නොවේ. ( )

09. පළමුවන පරාක්‍රමබාහු රජුගේ කාලයේදී විවිධ අවස්ථාවල නැටුම් ගැයුම් පැවති බව වාර්තා වේ. ( )

10. හින්දු ජනතාවගේ ආගමික උත්සවයක් ලෙස රාමසාන් උත්සවය හඳුන්වා දිය හැකිය. ( )

ප්‍රශ්න අංක 11 - 15 දක්වා ඈ කොටසේ දැක්වෙන ප්‍රකාශ වලට ගැළපෙන පිළිතුරු ඊ කොටසෙන් තෝරා යා කරන්න.

| ඈ | ඊ |
|---|---|
| 11. ශ්‍රී ලංකාවේ ලෝක උරුම වලට අයත් වේ. | 1. කර්ණ වේදන |
| 12. ලෝක උරුම වලට අයත් ස්වභාවික ගල තුළ නිර්මාණය කර ඇති සුවදායක ස්ථානයකි. | 2. වෙසක් උත්සවය |
| 13. ලන්දේසි ගෘහ නිර්මාණයට අයත් නිර්මාණ විශේෂයකි. | 3. රන්ගිරි දඹුලු ලෙන් විහාරය |
| 14. පැරණි හින්දු පොත්පත්වල කන් විදීම යනුවෙන් හඳුන්වන්නේ මෙනමිනි. | 4. ගාලු කොටුව |
| 15. රජරට ශිෂ්ටාචාර සමයේ පැවති උත්සවයකි. | 5. පැරණි අනුරාධපුර නගරය<br>6. දළදා මාළිගය |

අංක 16 සිට 20 තෙක් ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

16. ලෝක උරුම වලට අයත් පැරණි අනුරාධපුර නගරය තුළ ඇතුළත් නොවන අංගය වන්නේ,

(i) ලෝවාමහාපාය (ii) අභයගිරිය (iii) යටාලවෙහෙර (iv) ජේතවනාරාමය

17. සීගිරිය සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය තෝරන්න.

(i) සීගිරිය කාශ්‍යප රජුගේ නිර්මාණයකි.

(ii) සීගිරි ගල මුදුනේ නටබුන් සහිත ප්‍රදේශය අක්කර තුනක් පමණ වේ.

(iii) වේගයෙන් පහළට ගලන ජල ධාරාවකට සිදුරු කළ ගල් පතුරු යෙදීමෙන් ජලමල් නිර්මාණය කර ඇත.

(iv) සීගිරිය ගල මුදුනේ විශාල මාළිගාවක් තිබී නැත.

18. මූලාශ්‍ර වල දැක්වෙන රංග කලාවේ යෙදුණු රජකෙනෙකු නොවන්නේ,

(i) දුටුගැමුණු රජතුමා (ii) පළමුවන පරාක්‍රමබාහු රජතුමා

(iii) නිශ්ශංකමල්ල රජතුමා (iv) දෙවන පරාක්‍රමබාහු රජතුමා

19. අස්පෘෂ්‍ය උරුමය සඳහා අයත් වන්නේ,

(i) ගොඩනැගිලි (ii) චිත්‍ර (iii) මූර්ති (iv) ජනකවි

20. පැරණි ජනකවි වලට අයත් නොවන්නේ,

(i) පැල්කවි (ii) විරිඳු (iii) කරත්ත කවි (iv) පාරු කවි

## II කොටස

පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01. යුනෙස්කෝ සංවිධානයේ කාර්යය කුමක්ද?

02. ලෝක සංස්කෘතික උරුම තෝරා ගැනීමේදී සැළකිලිමත් වියයුතු කරුණු 02ක් ලියන්න.

03. ලංකාවේ පිහිටි ලෝක උරුම 06 පිළිවෙලින් නම්

කරන්න. 04. සීගිරිය පිළිබඳව වාක්‍ය 05ක් ලියන්න.

05. ධාතුසේන රජතුමා විසින් කලා වැව තැනවීම පිළිබඳව අනුරාධපුර ප්‍රදේශයේ පවතින ජනකවියක් ලියා දක්වන්න.

06. ජනකවි නිර්මාණය කිරීමට හේතු මොනවාද?

07. හින්දු පොත්පත්වල සඳහන් පහත වචනවල තේරුම් ලියා

දක්වන්න. ජාතකර්ම -

නාමකරණ -

විද්‍යාරම්භ -

08. අතීතයේ සාම්ප්‍රදායික දැනුම පැවති අවස්ථා 02ක් නම් කරන්න.

09. පහත දැක්වෙන කර්මාන්ත පිළිබඳව වාක්‍ය දෙක බැගින් ලියන්න.

වෙස්මුහුණු හා රූකඩ කලාව

ලාක්ෂා චිත්‍ර කලාව

10. අපේ සංස්කෘතික උරුමය රැකගත යුත්තේ ඇයි?